# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.09.25 පැය 0610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1792/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. හදිසි අනතුරකින් ස්වාමින්වහන්සේලා හත් නමක් අපවත්වී හය නමක් තුවාල ලැබීම - පන්සියගම පොලිස් වසම.**

2025.09.24 වන දින රාත්‍රී කාලයේ පන්සියගම පොලිස් වසමේ නා උයන ආරණ්‍ය සේනාසනයේ වැඩ වාසය කරන ස්වාමීන්වහන්සේලා 13 නමක් ගමන් ගත් ඩක්කුවක් හදිසි අනතුරට ලක්ව ඇත. අනතුරින් සියළුම ස්වාමීන්වහන්සේලා බරපතල තුවාල ලබා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමේදී ස්වාමීන් වහන්සේලා 07 නමක් අපවත් වී ඇත.

**අපවත්වූ ස්වාමීන්වහන්සේලා අවුරුදු 27 ත් 47 ත් අතර වයස්වල පසුවූ රුමේනියා, රුසියානු, ඉන්දියානු හා ශ්‍රී ලංකා ජාතික ස්වාමීන් වහන්සේලා වේ.**

බරපතල තත්ත්වයේ කුරුණෑගල රෝහලේ ප්‍රතිකාර ලබන සියලුම ස්වාමීන් වහන්සේලා ශ්‍රී ලංකා ජාතිකයින් වන අතර පන්සියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - ඇතිමලේ පොලිස් ස්ථානය.**

2025.09.24 වන දින දහවල් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ 50 කොටස ඩෝසර් වැවේ දිය නෑමට ගිය පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන්ව ඇති බවට ඇතිමලේ පොලිස් ස්ථානයට තොරතුරක් ලැබී ඇත. අතුරුදහන් වූ පුද්ගලයාගේ මෘත ශරීරය මේ වන විට සොයා ගෙන ඇත.

**මියගිය පුද්ගලයා වයස අවුරුදු 54 ක් වූ ඇත්මලේවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - මහවෙල පොලිස් වසම.**

2025.09.24 වන දින සවස් කාලයේ මහවෙල පොලිස් වසමේ පල්ලේපොල කොහොලන්වල මාර්ගයේ නිලව හන්දියේදී කොහොලන්වල දෙස සිට පල්ලේපොල දෙසට ධාවනය වූ ලොරි රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා මාතලේ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ පල්ලේපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - නිට්ටඹුව පොලිස් වසම.

2025.09.24 වන දින උදෑසන කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ කොළඹ මහනුවර මාර්ගයේ නාඹුළුව හන්දිය අසලදී කොළඹ දෙස සිට මහනුවර දෙසට ධාවනය වූ ටිපර් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී  අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වූ මාහේනගම, වරකාපොල ප්‍රදේශයේ පදිංචි පොලිස් කොස්තාපල්වරයෙකි.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ටිපර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - කල්පිටිය පොලිස් වසම.

2025.09.24 වන දින රාත්‍රී කාලයේ කල්පිටිය පොලිස් වසමේ කල්පිටිය පාලවිය මාර්ගයේ පාලකුඩාව ප්‍රදේශයේදී පාලවිය දෙස සිට කල්පිටිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් ගත් පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පදික පුද්ගලයා බරපතල තුවාල ලබා කල්පිටිය රෝහලට ඇතුලත් කිරීමේදී පදික පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ පාලකුඩාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසම.

2025.09.24 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ඉඟුරුකඩේ හන්දිය ඇප්රොච් මාර්ගයේ ඉඟුරුකඩේ හන්දිය ආසන්නයේදී වරාය දෙස සිට ඉඟුරුකඩේ හන්දිය අසලින් ඇප්රොච් මාර්ගයේ ධාවනය කල ලොරි රථයක් ඉදිරියෙන් ධාවනය වූ යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ ගොතටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**